# සීගිරි ගීයෙන් පිළිබිඹු වන කාන්තා ප්‍රතිමූර්තිය

**එස්. ආර්. නදීකා කුමුදිනී සිංහබාහු**

සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nadee19870312@gmail.com

## හැඳින්වීම

"සිතක ඇතිවන ලැදියාව එක් අතකට නැඹුරුව ගොරෝසු වී ගිය විට ද කළ පියා වුව මැරවීමට තරම් දරුණුය. ඒ ලැදියාවම තව අතකට නැඹුරුව මට සිලිටි වූ විට සීගිරිය වැනි කලා කෙතක් මැවීමට තරම් විසිතුරුය." එකම ලැදියාව යහපත් හා අයහපත් ලෙස ක්‍රියාත්මක වූ විට සිදු වන්නා වූ වෙනස සීගිරි කසුප්ගේ මේ දෙමුහුණුවරින් පැහැදිලි වනු ඇත. කාශ්‍යප රජු දැඩි වූ සිතින් උමතු වී පියා මරණයට පත් කිරීම ආනන්තරීය පාප කර්මයක් ලෙස පිළිකුලට ලක් කළ හැකි මුත් ආරක්ෂක ස්ථානයක අවශ්‍යතාව මත මෙන්ම සෞන්දර්යය ප්‍රිය කළ කලාකාමියෙකු ලෙස කලාත්මක බවින් අනූන වූ ආලකමන්දාවක් වූ සීගිරිය නිර්මාණය කිරීම ඓතිහාසික කලා කෙතට එක් කළ වටිනා වූ දායාදයකි.

සිය පියාණන් ඝාතනය කිරීමෙන් අනතුරුව ඇති වූ මානසික අසහනයත් මලණුවන්ගේ භාරත ගමනත් කාශ්‍යප රජතුමාට සීගිරි බලකොටුව නිර්මාණය කිරීමට උපස්ථම්භක වූ සාධක බව මහාවංසය සඳහන් කරයි.

*"කත්වා රාජඝරං තත්ථ - දස්සනෙය්‍යං මනොරමං*
*දුතියාලක මන්දංව - කුවෙරොව තහිං වසි"*

(මහාවංසය, 1959, 39-15)

මෙසේ වංසකථාවේ ගාථා කීපයකින්ම කාශ්‍යප රජුගේ සීගිරි නිර්මාණය විස්තර කෙරේ. නිස්සේණි ගෙහානි සීහාකාරෙන කාරෙයි.... ආදී වශයෙන් මහාවංස කතුතුමන් දක්වන පරිදි සිංහයෙකුගේ ආකාරයෙන් 'හිණිගෙවල්' කර වූ නිසා එම ස්ථානය සීගිරිය ලෙස හැඳින් වූ බව කියයි. මෙම ආලකමන්දාවෙහි අංගයන් අතරින් සීගිරි කැටපත් පවුරට ලැබෙන්නේ විශේෂ වූ ස්ථානයකි. මෙලෙස කාශ්‍යපාගමනයත් සමග ඉදි වූ ගොඩනැගිලි සමූහය අතරට ගැනෙන කැටපත් පවුර තත්කාලීන ගෘහ නිර්මාණ ශිල්පයේ දක්නට ලැබෙන ප්‍රාකාර විශේෂයකි. එම කැටපත් පවුරෙහි කාව්‍යෝචිත යෙදුම්වලින් සීගිරියට පැමිණි නොයෙක් තරාතිරම්වල ජනයා ස්වකීය සිතුම් පැතුම් සටහන් කරනු ලැබේ. ඒවායෙහි අන්තර්ගතය තුළ කාව්‍ය චින්තනය හා දෘෂ්ටිය මෙන්ම ඔවුන්ගේ ජීවන අත්දැකීම් ද විද්‍යාමාන වීම නිතැතින්ම සිදු විය.

මෙම සීගිරි ගී සමුච්චයේ අගය පළමු වරට අවධාරණය කළේ ලක්දිව ප්‍රථම පුරා විද්‍යා කොමසාරිස් ධූරය දැරූ H.C.P. බෙල් මහතා විසිනි. 1894 වර්ෂයේ සිට සීගිරියෙහි කැණීම් හා ගවේෂණ කටයුතුවල නිරත වූ බෙල් මහතා එම ස්මාරක සංරක්ෂණය කළ අතරම සීගිරි කුරුටු ගී පිළිබඳ ශාස්ත්‍රී අර්ථ නිරූපණයන් ඉදිරිපත් කිරීම සඳහා ද ප්‍රමුඛව කටයුතු කරනු ලැබිණි. ඒ යටතේ පුරාතන සිංහල අක්ෂර රූප මාලාවේ වර්ධනය මෙන්ම එහි වාග් විද්‍යාත්මක අගය විග්‍රහ කිරීම කෙරෙහි බෙල් මහතා උනන්දු විය. සීගිරි ගී සම්බන්ධව වැදගත් සංධිස්ථානයක් වූයේ 1928 දී ලක්දිව ශිලාලේඛන සහකාර තනතුර දැරූ සෙනරත් පරණවිතාන මහතා මෙම සීගිරි ගී සමුච්චය කියවා 'Sigiri Graffiti' නමින් කාණ්ඩ දෙකකින් යුතු කෘතියක් 1956 දී මුද්‍රණය කිරීමයි. ලක්දිව විද්‍යාමානව පවත්නා ඉපැරණිම කාව්‍ය

ගණයට ඇතුළත් සීගිරි ගීයෙහි අර්ථ විවරණයෙහිලා පරණවිතාන මහතා අතින් සිදු වූ සේවය ගෞරවපූර්වකව සිහිපත් කිරීම වටී.

**පර්යේෂණ ගැටලුව**

දුරු කතර ගෙවා පැමිණි සීගිරි ලෝලීන් සීගිරි පරිසරය තුළින් දුටු සුන්දරත්වය කවියට නැගූ නමුදු, පාරිසරික සුන්දරත්වය පරයා යමින් තළගනන්ගේ රූපශ්‍රීය මටසිලිටුව කවියට නිගන්නට ගත් උත්සහය සීගිරි ගී සමුච්චය පුරාවටම දක ගත හැකිය. මෙම සන්දර්භය තුළ **සීගිරි ගීය තුළින් පිළිබිඹු වන්නා වූ කාන්තා ප්‍රතිරූපය නිර්මාණය වී ඇත්තේ සමකාලීන සමාජ ආකල්ප තුළින්ද යන්න විග්‍රහ කිරීම** කෙරෙහි මෙම පර්යේෂණයේ දී ප්‍රමුඛත්වය දෙනු ලැබිණි.

**ක්‍රමවේදය**

සීගිරි ගීයෙහි ප්‍රධාන විෂයය ලෙස සිත්තම් ගත කාන්තා රූව පිළිබඳව අධ්‍යයනය කිරීමෙහිලා **ඓතිහාසික ක්‍රම වේදය හෙවත් සාහිත්‍යය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම** කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. එහි දී පරණවිතාන මහතා විසින් රචිත 'Sigiri Graffiti' නම් කෘතිය දක්වන්නේ මහත් වූ පිටිබලයකි. ඒ හැර 1905 දී නිකුත් වූ පුරාවිද්‍යා කොමසාරිස් බෙල් මහතාගේ වාර්ෂික පරිපාලන වාර්තාවෙහි ලියා ඇති " Inscriptions On Gallery Wall Sigirigala" නම් වූ ලිපියෙහි අන්තර්ගතය වඩා වටින්නේය. කෙසේ වෙතත්, වත්මන් සමයෙහි පළමු කොට සීගිරියට යෑමේ හා ශ්‍රී ලංකාවේ ඉතිහාසයට එහි ඇති වැදගත්කම අධ්‍යයනය කිරීමේත්, එය විදග්ධ ලෝකයාගේ අවධානයට යොමු කිරීමේත්, ගෞරවය හිමිවන්නේ මේජර් ෆෝබ්ස්ට ය. 'Eleven years in ceylon' නම් කෘතියෙහි තමා 1831 හා 1833 දී සීගිරියට ගිය ගමන් විස්තර ඇතුළත් ඇති සටහන් තුළින් සීගිරියෙහි අතීත ස්වභාවය පිළිබඳව චිත්ත රූපයන් මවයි. සීගිරියෙහි ඓතිහාසිකත්වය තහවුරු කිරීමෙහිලා මහවංසයෙහි උපයෝගීතාව ද වැදගත් ය. ඒ හැර පරණවිතානයන්ගේ සීගිරි ගී වියරණ, සීගිරි කුරුටු ගී, නන්දසේන මුදියන්සේ මහතාගේ සීගිරි ගී ප්‍රථම හා ද්විතීය භාගයෙන් ද ඇතුළු ද්විතියික මූලාශ්‍රය ගණනාවක්ම මෙම පර්යේෂණයේ දී පරිශීලනය කෙරිණි.

**අරමුණු**

සීගිරි ගී රචනා කළ බොහෝ කවීහු තම නම් ගොත් නිලතල ද සටහන් කළහ. ඒ තුළින්, රාජකීයන්, උසස් නිලධාරීන් මෙන්ම සාමාන්‍ය ගැමියන් වැනි විවිධ වූ සමාජ පන්තිවල පුද්ගලයන් ස්ත්‍රීත්වය අර්ථ දක්වූ අයුරු හඳුනා ගත හැකිය. ඒ ඒ පුද්ගලයාගේ දෘෂ්ටිය එකිනෙකට පරස්පර විරෝධී වූ බවක් මෙහිදී පෙනේ. සීගිරි ගීවලින් ගී තුන්සිය පනස් හතකට (357) ආසන්න ගණනක කතුවරුන්ගේ නම් සඳහන් වී තිබේ. එහෙත්, ගී තුන්සියයකට (300) වඩා වැඩි ගණනක කතුවරුන් සිය නම් හෙළි කිරීමට අදහස් කර නැත. මෙම ගීයන් අතර එම කාර්යයෙහි නිරත වූ ස්ත්‍රීන් ද සුළු සංඛ්‍යාවක් වූ බව මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි විය.

කිතග් බො (හිමි) අ (මිබු තිසා) හිමියම්බු

(Sigiri Graffiti, 1956, 266, 163)

මහහෙත් හිමියා අබු නාල් හිමිය බු

(Sigiri Graffiti, 1956, 543, 163)

ඉහත රචනයන් සීගිරි ගී ලියූ ස්ත්‍රීන් සඳහා නිදසුන් කීපයකි. ස්ත්‍රීන් අතින් ලියූ ගීතයන් ගණනින් දහයකට (10) ආසන්න සුළු ප්‍රමාණයක් වුවද ඒවායෙහි කාව්‍යාත්මක වින්දනය සහෘදයා වෙත අඩුවක් නොමැතිව ලබා දුන් බවට කිසිදු සැකයක් නැත. ඒ අනුව, මෙකල කාන්තාව සතු අධ්‍යාපනික පරිසරය පිළිබඳ ඉඟියක් ඒ තුළින් සපයයි. එබැවින් කාන්තාවන් කාව්‍ය රචනයෙහිලා දක් වූ දක්‍ෂතාවය හඳුනා ගත හැකිය. තවද, ස්ත්‍රීන් විසින් 'ස්ත්‍රීත්වය' අර්ථ නිරූපණය කළ අයුරු ද මෙම ගීතයන්වලින් පැහැදිලි වීම වැදගත් කරුණකි.

මෙහිදී, පර්යේෂණ ගැටලුව ඔස්සේ කරුණු අධ්‍යයනය කිරීමේදී සීගිරි කුරුටු ගී, සීගිරි චිත්‍ර වස්තු විෂයය කොට රචනා වූ ගීතයන් මෙන්ම එම සියලු ගීතයන් රචනා කළ රචකයන්ගේ තරාතිරම අධ්‍යයනය කිරීම ද වැදගත් විය. සීගිරි ගී ලියූවෝ එහි තිබූ චිත්‍ර දක ඒවායෙහි සිටි කතුන්ගේ භාවයන්ගෙන් කුල්මත් වී තම සිතැඟි ගීවලින් ලියූහ. විශේෂයෙන් ඒවායෙහි ශෘංගාර රසය පිළිබිඹු වූ බව පෙනේ. ශ්‍රී ලංකාවේ සෑම කවියෙකුගේම උපකරණ සම්භාරයෙහි ප්‍රධාන අවිය වූ 'උපමා' සීගිරි ගී පුරාවටම යොදා ගෙන තිබේ. විශේෂයෙන්ම ස්ත්‍රී

ලාලිත්‍ය ප්‍රකාශනයේ දී උපමා රූපක භාවිතා කර තිබේ.

සුන්දර ස්ත්‍රියකගේ මුහුණ සඳට ද 'නිම්පතෙක්හි (සඳ) හය් එක් වනා' (Sigiri Graffiti, 1956, 394), දත් මුතුවලටද 'දසන් මුතුපලවන්' (Sigiri Graffiti, 1956, 648) කෙස් කළු වළාකුළුවලට ද 'නොවි වරල් නිල් වලා සිහිල්'(Sigiri Graffiti, 1956, 331) සම කර තිබේ. තවද ළඳුන්ගේ ඇහිබැම නිඹපත්වලට, තොල් නාදළුවලට (සීගිරි ගී, 2000, 394) නෙත් මිණි පහන්වලට (සීගිරි ගී, 2000, 50) උපමා කිරීම ගතානුගතිකත්වයෙන් අඩුය.

**මහනෙල් වනක සමිඟ හඳුන් රන්වන් ලිය**
**නිල්කටරොළු මලසේය**

(Sigiri Graffiti, 1956, 354)

මෙය උපමා රූපක සඳහා වඩාත් උචිත නිදර්ශනයකි. ඒ අනුව, සීගිරි ගී තුළින් ස්ත්‍රීත්වයෙහි අලංකාරය, ලාලිත්‍ය ඕනෑවටත් වඩා කියා පාමින් ඇය ස්වභාව සෞන්දර්යයේ දායාදයක් කිරීමට ගත් උත්සහය පැහැදිලි වනු ඇත.ඒ අනුව සීගිරි ගීයෙන් පිළිබිඹු වන කාන්තාවගේ බාහිර අලංකාරය මෙන්ම ඇඳුම් පැළඳුම් ඇය අනුගමනය කළ සිරිත් විරිත් ආදිය අධ්‍යයනය කිරීම කෙරෙහි ද අවධානය යොමු විය. බොහෝ දෙනෙකුට සුන්දර වූ ලියන් තවත් සමහරෙකුට එතරම් සුන්දර නොවීය. එසේම කාන්තාව ද ඇගේ චරිතය ද යහපත් මෙන්ම අයහපත් ලෙසින් සීගිරි කවීන් විග්‍රහ කරනු ලැබිණි.ඒ අනුව ස්ත්‍රියකගේ සුන්දරත්වය ප්‍රකාශ කරමින්ම එම ලාලිත්‍ය තුළින් ජීවිත අවබෝධයක් ලබා දීමට ද සීගිරි කවියා ගත් උත්සහය පරීක්ෂා කිරීම ද මෙම පර්යේෂණයෙහි දී සිදු විය. මේ අතර වඩාත් වැදගත් වූයේ, සීගිරි චිත්‍ර තුළින් පිළිබිඹු වන ස්ත්‍රීන්ගේ චරිතයන් සැකයට භාජනය කරමින් හෝ ස්ත්‍රීන් කෙරෙහි ලොල් වීමෙහි මාරක විපාක විස්තර කරමින් රචිත ගීතයන් ද සීගිරි ගී අතරින් හමුවීමයි. එවැනි රචනයන් බිහි වීමට හේතු වූයේ විවිධ පුද්ගලයන් අතින් ගී රචනයේ දී සමකාලීන සමාජ ආකල්පවල බලපෑම එම ගීතයන් සඳහා හේතු වීමද යන්න මෙහිදී අධ්‍යයනය කෙරිණි.

**"රුචි උපදවන පැහැබර සිනා ඇති සිත් සතුටු කරවන ලියක කෙරෙහි ළැදිව මන බැඳීම මැණික් හෙණ්ඩුවක් හිසෙහිලා ගන්නා වැන්නා"**

(Sigiri Graffiti, 1956, 306)

ව්‍යාංගාර්ථය තුළින් සීගිරි ගීය ස්ත්‍රියට කරන ලද නිගරුව ඉහතින් පැහැදිලි වනු ඇත. මෙහිලා සිහියට නැගෙනුයේ මානව ප්‍රජාවෙහි පැවැත්මට උර දෙන්නා වූ ස්ත්‍රිය පශ්චාත් වෛදික යුගයෙහි එක්ව සයනයෙන් මරණය අත්වන බව කියමින් පවා නින්දාවට ලක් වූ අයුරුය. එය මෙසේ සඳහන් කරයි.

*දර්ශනං චිත්ත වෛකල්‍යං - ස්පර්ශං ධනවිනාශං*
*ශයනං මරණං කුයාත් - ස්ත්‍රී ප්‍රත්‍යක්ෂ රාක්ෂසී*

(ප්‍රත්‍යශතකය, 1997, 26, 09)

මෙබඳු ආකල්පයන් සීගිරි ගීය තුළද නිරූපණය වූ බව මීට පෙර ඉහතින් දක්වන ලදී. එබැවින් මෙම ආකල්පයන්ගෙන් පීඩිත අවධියක් පැරණි ලක්දිව සමාජය තුළ ද තිබෙන්නට ඇතැයි යන උපකල්පනයට එළඹීමේදී සීගිරි ගී නිදර්ශන ලෙස භාවිත කළ හැකි බවයි. ඒ පිළිබඳවද අධ්‍යයනය කිරීම කෙරෙහිද මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරේ.

## උපකල්පනය

මෙම ප්‍රධාන අරමුණු ඔස්සේ අධ්‍යයනය කිරීමේ දී විවිධ සමාජ පන්තීන් නියෝජනය වන පරිදි සීගිරි ගී රචනා වී ඇති බැවින් තරාතිරම,පුද්ගල ආකල්ප මෙන්ම සමකාලීන සමාජ ආකල්පවල බලපෑමද සීගිරි ගී රචනයේ දී හේතු වී තිබෙන බවත් සීගිරි ගී තුළින් මූර්තිමත් වන්නේ සමකාලීන ස්ත්‍රියගේ ස්වභාවය බවත් මාගේ උපකල්පනය විය.

## නිගමනය

ඒ අනුව, සමස්ත පර්යේෂණයෙහි අන්තර්ගතය තුළින් මා එළඹි නිගමනය නම් ස්ත්‍රීන් විසින් ලියූ සීගිරි ගී තුළින් සමකාලීන ස්ත්‍රීන්ගේ අධ්‍යාපනික මට්ටම උසස් තත්ත්වයක තිබූ බවයි.එමෙන්ම එම ගීතවලින් සමකාලීන ස්ත්‍රියගේ බාහිර ස්වරූපය හා ඇගේ චර්යාවන් පිළිබිඹු වන බවද පැහැදිලිය. එහෙත් සමාජයේ පුරුෂ පක්ෂයෙන් බහුතරය කාන්තාව සමාජයට

අවැඩදායක තැනැත්තියක ලෙස අවමානයට ලක් කළ ඇති බවත් නිගමනය කළ හැකිය. ඒ අනුව සමකාලීන සමාජ ආකල්පවල බලපෑම කාන්තාව කෙරෙහි ද, එම තත්ත්වය සීගිරි ගී රචනයේදී ද බල පෑ බව පැහැදිලිය. මෙබඳු තත්ත්වයක් මත වුවද සීගිරි ගී සමුච්චයෙහි බොහෝ දුරට ස්ත්‍රියගේ සෞන්දර්යාත්මක වටිනාකම විස්තර කිරීමට සීගිරි කවීන් ගත් උත්සාහය අගය කළ යුතුය.

**ආශ්‍රෙය ග්‍රන්ථ**

ඌන පූරණ සහිතො මහාවංසො (1959) පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිර, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

ප්‍රත්‍යශතකය (1997), එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

මහාවංසය (2006), ඉලංගසිංහ, මංගල (සංස්.) ඡ්‍ස් එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

පරණවිතාන, එස් (2000), සීගිරි කුරුටු ගී, ගම්ලත්, සුචරිත (පරි.), පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

Sigiri Graffiti (1956), Paranavitana. S, Oxford University Press, London